# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු , ජාතික ඒකාබද්ධතා , සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය

புத்த சாசனம், சமய மற்றும் கலாச்சார அலுவல்கள், தேசிய ஒருமைப்பாடு,சமூக பாதுகாப்பு மற்றும் ஊடகத்துறை அமைச்சு

Ministry of Buddhasasana, Religious and Cultural Affairs , National Integration , Social Security and Mass Media


මගේ අංකය / எனது இல / My No: DSD/HO/14/SS/2/VII/3/2024

ඔබේ අංකය / உமது இல / Your No: ..........

දිනය / திகதி / Date: 2024.11.06

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛ (සමාජ ආරක්ෂණ) අංක - **2024/12**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම දිස්ත්‍රික් විෂයභාර කළමණාකරුවන්,
සියළුම දිස්ත්‍රික් විෂයභාර නිලධාරීන්,
සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු,බැංකු සමිති කළමණාකරුවන්,
සියළුම මූලස්ථාන කළමණාකරුවන්,
සියළුම විගණන නිලධාරීන්,
සියළුම විෂයභාර නිලධාරීන්,
සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත.

**සමෘද්ධි සමාජ සංවර්ධන අරමුදල "සමෘද්ධි සිප්දොර" ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම - 2024/2026 අධ්‍යයන වර්ෂය**

**හැඳින්වීම**

2024/2026 අධ්‍යයන වර්ෂයට අදාලවද සමෘද්ධි සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් අනුව මෙම වර්ෂයට අදාලව අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ පන්ති 2024 ජුනි මාසයේ තාවකාලිකව ආරම්භ කර ඇති අතර, මෙම අධ්‍යයන වර්ෂයට අදාලව සිසුන් වෙනුවෙන් ශිෂ්‍යත්ව පිරිනැමීම 2024 ජුලි මස සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය.

ඒ අනුව 2023 අධ්‍යයන වර්ෂයට අදාලව 2024 මැයි මාසයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනි සිට විභාගය සමත් හා චක්‍රලේඛයේ මතු දැක්වෙන 03 ඡේදයට අනුව සුදුසුකම් සම්පූර්ණ කරන ලද සිසුන් මීට ඇතුලත් වනු ඇත.

තවද DSD/HO/14/SS/2/VIII/3/2023 අංක හා 2024.03.04 දිනැති චක්‍රලේඛය අනුව,2022/2024 හා 2023/2025 අධ්‍යයන වර්ෂ වෙනුවෙන් මේ වන විටත් සමෘද්ධි සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක වේ.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

**02.**වැඩසටහන ක්‍රියාත්මක කිරිමේ අරමුණු

2.1) 2023.06.30 දින වන විට සමෘද්ධි සහනාධාරය හිමිව සිට අස්වැසුම ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට තේරී පත් නොවූ අඩු ආදායම්ලාභී පවුල් වල පාසල් යන වයසේ දරුවන් පාසල් අධ්‍යාපනයෙන් ඉවත් වීම වළක්වා ගැනීම.

2.2) එම පවුල්වල දක්ෂතා හා කුසලතා ඇති දූ දරුවන් ගේ අනාගත අධ්‍යාපනය සුරක්ෂිත කිරීම සහ උසස් අධ්‍යාපන වරම් ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීමට සහය වීම.

2.3) මෙම පවුල්වල දරුවන් සඳහා යහපත් සමාජ, ආර්ථික පරිසරයක් ගොඩනගා ගැනීමට උපකාරි වීම තුළින් සමාජයට වැඩදායී පුරවැසියන් රටට දායාද කිරීම හා රටේ සංවර්ධනයට දායක කර ගැනීම

2.4) සමස්ත ජාතික සංවර්ධන ක්‍රියාදාමය තුල මානව ප්‍රාග්ධනය පුළුල් කිරීම

**03. සිප්දොර ශිෂ්‍යාත්වය අයදුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම්:-**

3.1) 2023.06.30 දිනට සමෘද්ධි සහනාධාර හිමි වූ ,මේ වන විට අස්වැසුම ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට තේරී පත් නොවූ අඩු ආදායම්ලාභී පවුලක දරුවෙකු වීම.

3.2) 2023(2024) අධ්‍යයන වර්ෂයට අදාල අ.පො.ස.(සා.පෙ.) විභාගයට පෙනී සිට,විභාගය සමත්වී 2024/2026 වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) හදාරන ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක බවට විදුහල්පතිවරයාගේ තහවුරුව ලබා ගැනීම.

3.3) අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ස්ථිර පදිංචිකරුවෙකු වීම.

3.4) තම ග්‍රාම සේවා වසම අයත් සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ සමෘද්ධි සිසුරක ගිණුම් හිමියෙකු වීම.

3.5) රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ශිෂ්‍යත්ව වැඩසටහන් හා ජනාධිපති අරමුදල මගින් ක්‍රියාත්මක කරනු ලබන ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ ප්‍රතිලාභ හිමි නොවන සිසුවකු වීම.

04. **ශිෂ්‍යත්වය අහෝසිවීම**

4.1) ශිෂ්‍යත්වලාභියා පාසල් අධ්‍යාපනය හැර යාම.

4.2) ශිෂ්‍යත්වලාභියා විවාහ විම.

4.3) ශිෂ්‍යත්වලාභියා මියයාම.

4.4) නව පවුල වෙත අස්වැසුම ප්‍රතිලාභ හිමි වීම

**0.5 ශිෂ්‍යත්වලාභීන් දැනුවත් කිරීම, අයදුම්පත්‍ර භාරගැනීම සහ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත්‍ර සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය.**

5.1) **ශිෂ්‍යත්වලාභීන් දැනුවත් කිරීම**

මෙම සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන පිළිබඳව අදාල වසමේ පදිංචි ඉහත සුදුසුකම් ලද සියළුම ප්‍රතිලාභී දරුවන් දැනුවත් කිරීම සිදු කල යුතුය. එහිදී දැන්වීම්, රැස්වීම් ආදිය මගින් දැනුවත් කිරීමේ කටයුතු සිදුකිරීම වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරියා/නිලධාරිනියගේ සහ කළමණාකරුවන්ගේ සෘජු වගකීමක් වේ. ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් වන පැමිණිලි අනුව ප්‍රතිලාභ හිමි විය යුතු පිරිස් දැනුවත් නොවන බවට කරුණු අනාවරණය වී ඇති බැවින්, මේ පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්ගේ වගකීමක් වේ.

5.2). **අයදුම් පත්‍ර භාර ගැනීම සහ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත්‍ර සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය.**

මේ සමඟ අමුණා ඇති ඇමුණුම් අංක 01 ආකෘති පත්‍රය අනුව අයදුම්කරු විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය, වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින්,අදාල නිර්දේශ සහ සමෘද්ධි කලාප භාර කළමණාකරුගේ නිර්දේශය ද සහිතව 2024.11.25 දිනට පෙර සමෘද්ධි මූලස්ථාන කළමණාකරු වෙත භාර දිය යුතුය. මේ වන විට සමෘද්ධි ප්‍රජා මූල බැංකුවේ සිසුරක ගිණුමක් ආරම්භ කර නොමැති නම් අයදුම් පත්‍රය සම්පූර්ණ කරන අවස්ථාවේ දීම සිසුරක ගිණුමක් ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස අයදුම්කරුවන් දැනුවත් කල යුතු වේ. ගිණුම් ආරම්භ කිරීම සඳහා මේ වන විට සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ මගින් මීට අදාලව ලබා දී ඇති උපදෙස් අනුව ක්‍රියාකල යුතුය.

2024/2026 අධ්‍යයන වර්ෂයට අදාලව අ.පො.ස.(උ/පෙළ) අධ්‍යාපන කටයුතු ආරම්භ වි ඇති බැවින් සිප්දොර ශිෂ්‍යත්ව වාරික ගෙවීම සිදු කිරීම සඳහා අධ්‍යයන වර්ෂයට අදාලව අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2024.11.25 දින වේ.

වැඩසටහන ආරම්භයේම තම වසමේ හිමිකම් ලැබූ ශිෂ්‍යත්වලාභී ප්‍රමාණය නිවැරදිව ගණනය කර ගැනීම අදාල වසම් භාර නිලධාරියාගේ වගකීම වන අතර, පසුව හඳුනාගනු ලබන ශිෂ්‍යත්වලාභීන් වෙනුවෙන් ප්‍රතිලාභ ලබා දීමට නොහැකි වනු ඇත. එසේම මෙම ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ හිමිකම් ලැබූ ශිෂ්‍යත්වලාභියකු මග හැරී ගියහොත් හෝ අදාල ගෙවීම් කාලය තුල ශිෂ්‍යත්ව හිමිකම් නොගෙවා ඇති අවස්ථාවන් අනාවරණය වුව හොත් අදාල වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ඊට සෘජුවම වගකිව යුතු වේ. ඒ අනුව අධීක්ෂණ මට්ටමේ නිලධාරින්ද මේ පිළිබඳව වගකීමට බැඳෙනු ඇත.

06. **ශිෂ්‍යත්ව දීමනා ගෙවීම**

6.1) 2024/2026 අධ්‍යයන වර්ෂයට අදාලව 2024 ජුලි මාසයේ සිට වසර 2ක් (උපරිම මාස 24 ක් ) මසකට රු.1,500/- බැගින් ශිෂ්‍යත්ව ප්‍රතිලාභය ලබා දිය යුතුය. (හිඟ මුදල් සහිතව)

6.2) සිසුන් උසස් පෙළ හදාරන බවට විදුහල්පතිගේ සහතිකය මාසිකව ලබා ගැනීමේ දී යම් අපහසුතාවයක් වේ නම් පමණක්, අදාල ශිෂ්‍යා, ශිෂ්‍යාව පාසැල් යන බවට වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරිගේ නිර්දේශය ලබා ගෙවීම් කල හැකිය. එහෙත් මාස 06 කට වරක් අනිවාර්යයෙන්ම අදාල ශිෂ්‍ය/ ශිෂ්‍යාව එම විදුහලේ උසස් පෙළ හදාරන බවට විදුහල්පති විසින් සහතික කරවා ගත යුතුය.

6.3) වසංගත වැනි සුවිශේෂී තත්ව යටතේ ගෙවීම් කටයුතු නියමිත පරිදි සිදුකල නොහැකි අවස්ථාවලදී ශිෂ්‍යත්වලාභියා අධ්‍යයන කටයුතුවල නිරතවන බැව් තහවුරු වන්නේ නම් වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරියා, කලාප කළමණාකරු සහ මූලස්ථාන කළමණාකරුගේ නිර්දේශය මත පාසල් නියමිත පරිදි විවෘත වන තෙක් ගෙවීම් කල හැකිය.

6.4) ශිෂ්‍යත්වලාභියකු සිටින පවුලක පදිංචිය මාරු වීමේ දි වසමේ පදිංචිය හැර ගිය බවට ග්‍රාම නිලධාරි තහවුරුව සමග තම බැංකුවේ සිසුරක ගිණුම් හිමි ශිෂ්‍යත්වලාභියකු බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව චක්‍රලේඛ උපදෙස් පරිදි ශිෂ්‍යත්වලාභීන් වෙත ගෙවීම් කිරීමට හැකිය.

6.5) ශිෂ්‍යත්ව ප්‍රදානයේදී ශිෂ්‍යත්වලාභියා ගෙන් අවශ්‍ය ලිපි ලේඛණ ලබා ගැනීමෙන් අනතුරුව ශිෂ්‍යත්ව මුදල් ගිණුමට බැර කල යුතුය.

**7. ශිෂ්‍යත්වලාභි නාම ලේඛන ඇතුලත් සාරාංශගත වාර්තා හා ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම**

7.1) ඒ අනුව ශිෂ්‍යත්ව අපේක්ෂිත ශිෂ්‍ය/ශිෂ්‍යාවන් ඇමුණුම 01 පරිදි පුරවන ලද අයදුම්පත්හි තොරතුරු වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ අත්සන සහිතව සමෘද්ධි බැංකු කලාප කළමණාකරු වෙත ඉදිරිපත් කර අත්සන හා නිල මුද්‍රාව සහිත අයදුම් පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මූලස්ථාන කළමණාකරු වෙත, ප්‍රාදේශීය ලේකම් අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතු වේ.

7.2) ඇමුණුම 02 මඟින් කලාප මට්ටමට මෙම තොරතුරු සාරාංශ කර තබා ගැනීම කලාප භාර කළමණාකරුගේ වගකීම වේ.

7.3) අනතුරුව මෙලෙස කලාප මට්ටමෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන සාරාංශ වාර්තාව ඇමුණුම 03 පරිදි මූලස්ථාන කළමණාකරු විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සාරාංශ කල යුතු අතර ප්‍රාදේශීය ලේකම් අනුමතියෙන් 2024.11.25 දිනට පෙර දිස්ත්‍රික් කාර්යාල වෙත යොමු කල යුතුවේ.මෙම දිනට පෙර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අදාල තොරතුරු ලබාදීම සඳහා ප්‍රාදේශීය මට්ටමට කාල කළමනාකරණය කරගැනීමට අදාල නිලධාරීන් කටයුතු කළ යුතු වේ. අනතුරුව ප්‍රාදේශීය මට්ටමේ සාරාංශ තොරතුරු ඇසුරින් අමුණුම් අංක 04 පරිදි දිස්ත්‍රික් මට්ටමට සකස් කර ගෙවීම් සඳහා දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ අනුමැතියෙන් 2024.12.05 ප්‍රධාන කාර්යාලයේ සමාජ ආරක්ෂණ හා සුභසාධන අංශයේ විද්‍යුත් තැපැල ssfsamurdhi@yahoo.com වෙත ලබා දීමට කටයුතු කළ යුතුය.
ඒ අනුව අදාල වාරික මුදල් ගෙවීමට කටයුතු කරනු ඇත.

08. **ගෙවීම් ගිණුම් ගත කල යුතු ආකාරය**

8.1) සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ ශිෂ්‍යත්වලාභියා නමින් ආරම්භ කරන ලද "සිසුරක" ගිණුමට ශිෂ්‍යත්ව වාරික මුදල් තැන්පත් කල යුතුය.

8.2) ශිෂ්‍යත්ව මුදල් බැංකු ගිණුමට බැර කල වහාම ශිෂ්‍යත්වලාභීන් දැනුවත් කිරීමට කටයුතු කල යුතුය.

8.3) ශිෂ්‍යත්ව මුදල් බැංකු ගත කරන අවස්ථාවේදීම අදාල ශිෂ්‍යත්වලාභියාගේ හිමිකම් පත්‍රයේ මුදල් ගෙවූ දිනය නිවැරදිව සටහන් කිරීමට කටයුතු කල යුතුය. අරමුදලේ පිරිවැය අවම කර ගැනීම සඳහා, හිමිකම් පත්‍රය මුද්‍රණය කර ලබා දීම සිදු නොවන බැවින් හිමිකම් පත්‍රයේ ඡායා පිටපතක් භාවිතා කිරීමට කටයුතු කිරීමට උපදෙස් දෙනු ලැබේ.

8.4) තවද මේ වන විට සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ගෙවීම මාර්ගස්ථ ක්‍රමය (ONLINE) හරහා ගෙවීම් සිදුනොවන බැවින් සියළු ගෙවීම් ඉහත ක්‍රම වේදය හරහා සිදුවනු ඇත.

ඉහත තෝරාගත් පවුල්වල සිසු සිසුවියන්ගේ අධ්‍යාපන කටයුතු ඉහල නැංවීම සඳහා ක්‍රියාත්මක කරන මෙම සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහනේ සාර්ථකත්වය උදෙසා ඔබ ඇතුළු කාර්යය මණ්ඩලය දක්වන සහය ඉතා අගය කොට සලකමි.

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1 . ලේකම් - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා,
සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය - කා. දැ.ගැ.ස.
2. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
(ඉදිරියේ දී ශිෂ්‍යත්වලාභී නාම ලේඛණය ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.)
3. ප්‍රධාන ගණකාධිකාරි - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -කා.දැ.ගැ.ස.හා අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
5. සියලුම අංශ ප්‍රධානින්,සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස. සහ අ.ක.ස.